මගේ අංකය: 01/19/ඉ.ස/චක්‍ර/2008
No.

ඔබේ අංකය: 01/02/2008
Your No.

දුරකථන අංකය
Telephone Nos: 2 121071, 2 121072

ෆැක්ස් අංකය
Fax No.: 2 121074

ඊමේල්
E-mail: regisdergen @ sltnet. lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය
இணையத் தளம்
Web Site: www. rgd.gov.lk

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No.: 565

280, කොළඹ 11.
280, Main Street,
Colombo 11.

දිනය/Date: 2008.02. 8

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍රවල අනුප්‍රාප්තිකයන් නම්කිරීම හා අවලංගු කිරීම - ඉ.කො. 155 ආකෘතිය ලියා පදිංචි කිරීම.

ඉහත කරුණට අදාලව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් මා වෙත එවා ඇති ඔහුගේ අංක රන්බිම/චක්‍රලේඛ/2007 සහ 2007.12.31 දින දරණ ලිපියේ සහ ඒ සමග වූ ඇමුණුමේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

02. ලියා පදිංචිය සඳහා ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර වල අනුප්‍රාප්තිකයන් නම් කිරීම හා අවලංගු කිරීම සඳහා වූ ඉ.කො. 155 ආකෘතිපත්‍ර නිසි පරිදි සම්පූර්ණ නොකර ලියා පදිංචි කිරීමට එවීමත් එවැනි ආකෘති ලියා පදිංචි කිරීම මගින් එම ලේඛණවල පසුව සිදු කරනු ලබන වෙනස් කිරීම මගින් කූට ලේඛණ පිළියෙල වූ අවස්ථා පිළිබඳව මහජනතාව ගේ පැමිණිලි ලැබෙමින් පවතින බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ ඉහත කී ලිපියෙන් මා වෙත දන්වා ඇත. එසේම එම තත්වය වැළැක්වීම සඳහා නිසි පරිදි සම්පූර්ණ නොකර ඉදිරිපත් වන ඉ.කො.155 ආකෘති පත්‍ර ලියා පදිංචි නොකර ආපසු යවා නිසි පරිදි සම්පූර්ණ කළ පසු පමණක් ලියා පදිංචි කිරීමට කටයුතු කරන්න.

03. ඒ අනුව මින් ඉදිරියට ඉ.කො. 155 ආකෘති ලියා පදිංචිය සඳහා ඔබ වෙත ඉදිරිපත් වූ විට මේ සමග අමුණා ඇති ලේඛණයේ සඳහන් මූලික කරුණු සපුරා නොමැති නම් එවැනි ලේඛණ ලියා පදිංචි නොකර ආපසු යැවීමට පියවර ගන්නා ලෙස දන්වා සිටිමි. එම ලේඛණවල සත්‍යතාවය පිළිබඳව සැකයක් මතුවේනම් ඒවා අදාල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යවා ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව තහවුරුවක් ලබා ගත හැකි බවද සොක්වා දෙමි.

අ.කලේ: ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්: 1. ඉඩම් කොමසාරිස් ජනරාල් - මෙ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ කටයුතු ඔබ විසින් සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙමි.
ප්‍රාන්තලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත - දැ.ගැ.ස.